**කොළඹ විශ්ව විද්‍යාලයය, ශ්‍රී ලංකාව**
**නීති පීඨය**
**නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර-2021 (මාර්ගගත)**

# පොදු අන්තර්ජාතික නීතිය

(පැ තුනයි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව: 06

**ප්‍රශ්න තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න

(අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.)

---

1. 21 වන සියවසේ නීතිඥයෙකු, අවිනිශ්චිතභාවය හා ප්‍රතිවිරුද්ධතාවයන් අන්තර්ජාතික නීතියේ ස්වභාවයේ කේන්ද්‍රය වන බවත්, යම් වර්ධනයක් සිදුවන්නේ නම් එය දැනට පවත්නා අන්තර්ජාතික නීති පද්ධතියේ ඇති බාධාවන් සහ ව්‍යුහයන් තුළ පමණක් සිදුවන බවත් දැනුවත් වී සිටිය යුතුය. තවද නිරන්තරයෙන් ස්ථරයන්ගේ සමපාත වීමක් සිදු වුවද අන්තර්ජාතික ක්‍රියාවලියෙන්, දේශීය ක්‍රියාවලීන්ට ආදේශකයක් නොවේ සමාජ සුබසාධනය හා යුක්තිය උදෙසා වන අනුපූරකයන් පමණක් බවත් පිළිගත යුතුය.
   ඔබගේ තර්කය තහවුරු කිරීමට අදාල න්‍යායාත්මක හා ප්‍රායෝගික උදාහරණ සමග ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

   (ලකුණු 100)

2. රෙඩ්වුඩ් රාජ්‍යයේ ලියාපදිංචි විශාල බහු ජාතික කැනීම් සහ ඇව සමාගමක් වන රෙඩ්ලීප් සමාගම, මෑතකදී සේලා හි පිහිටි හරිත වනරක්ෂිතයේ " ඕනෑම ආර්ථික ක්‍රියාකාරකමක්" සිදු කිරීම පිණිස වන බලපත්‍රය සේලා රාජ්‍යයේ ආණ්ඩුවෙන් හිමිකර ගන්නා ලදී. රෙඩ් ලීප් දැනටමත් වනාන්තර භූමියෙන් අක්කර සිය ගණනක් හෙළිකිරීම ආරම්භකර තිබේ. මෙම තත්ත්වය පිළිබඳව වාර්තා කරනුලැබූ ජනමාධ්‍යවේදීන් දෙදෙනකු පසුගිය මාසයේදී වෙඩි තැබුම් තුවාල සහිතව මියගොස් සිටිය ද, දේශීය පොලිසිය එම මරණයම ද්විත්වයම සියදිවිනසාගැනීම් ලෙස ප්‍රකාශයට පත්කර තිබේ.

‘ලාස්ට් චාන්ස්’ යනු සේලා හී ස්ථාපිත අන්තර්ජාතික රාජ්‍යනොවන සංවිධානයකි. සාමියන් ජාතිය, සේලා හි ජීවත්වන ස්වදේශික ජන කණ්ඩායමකි. ලාස්ට් චාන්ස් සහ සාමියන්වරු ඉහත තත්ත්වය අන්තර්ජාතික නීතිය උල්ලංඝනය කිරීමක් ලෙස විශ්වාස කරති. එබැවින්, ඔවුන්ට ඕනෑම අදාළ අන්තර්ජාතික ව්‍යුහයක් ඉදිරියට ගොස් මෙම තත්ත්වය පිළිබඳව විරෝධතාවයපාමින් යුක්තිය ලබා ගැනීමට අවශ්‍ය වේ.

ඔබ අන්තර්ජාතික නීතිඥයකු බව උපකල්පනය කරන්න. අන්තර්ජාතික නීතිය ඇසුරින් අයිතිවාසිකම් වල ස්වභාවය ඉහත සිදුවීමේ දී හඳුනාගත් අයගේ බැඳියාවන් සහ වගකීම් පිළිබඳ අදහස් දක්වන්න.

(ලකුණු 100)

3. <u>**අ, ආ සහ ඇ කොටස් තුනටම**</u> පිළිතුරු සපයන්න

මෙගා, ඕලා සහ ශෝරා යනු පරමාධිකාරී රාජ්‍යයන් තුනකි. ධාරා නැමැති සන්නද්ධ කණ්ඩායමක් සමඟ ශෝරාට අභ්‍යන්තර අරගලයක් පවතී. ධාරා හි නායකයා වන්නේ ශෝරා හි පුරවැසියෙකු වන සොනාල් ය.

අ. සොනාල් ශෝරා හී 2021 අප්‍රේල් මස පැවැති අන්තර්ජාතික සංස්කෘතික උත්සවය අතරතුර දී ප්‍රහාරයක් සැලසුම් කර දියත් කරන ලදී. මෙම ප්‍රහාරයේ ප් ප්‍රතිඵලයක් ලෙස ශෞ්රා හී පුරවැසියන් 100 දෙනෙකු හා මෙගා හි පුරවැසියන් 50ක් ජීවිතක්ෂයට පත් වූ අතර 1000ක් පමණ පිරිසක් තුවාල ලැබීය. මෙම ප්‍රහාරයෙන් මසකට පසුව මෙගා හි පුරවැසියකු බවට සඳහන් වන වංචනික ගුවන්ගමන් බලපත්‍රයක් සමග ගමන් කිරීම හේතුවෙන් ඕලා හි දී සොනාල් ව අත්අඩංගුවට ගන්නා ලදී. උත්සවයට සිදුකරනු ලැබූ ප්‍රහාරය සම්බන්ධයෙන් මෙගා සහ ශෝරා යන රාජ්‍යයන් දෙකටම සොනාට එරෙහිව නඩු පැවරීමට අවශ්‍ය වේ. මෙගා හා ශෝරා වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 50)

ආ. මේ අතරතුර, ධාරා කණ්ඩායමට අවි ආයුධ සපයන්නා වන ඩැනී නැමැත්තා මෙගා හී පුරවැසියෙකු හා පදිංචිකරුවෙකු වන බව අනාවරණය විය. ව්‍යාපාරික සංචාරයක යෙදෙන අතරතුර ඔහුව ශෝරා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.
ශෝරා වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 25)

ඇ. ඉහත අවස්ථාපිත සාධක මත , උත්සවයට සිදුකරන ලද ප්‍රහාරය සම්බන්ධයෙන් සොනාල් හෝ ඩැනී සම්බන්ධව විමර්ශනයක් ආරම්භ කර නඩු පැවරීම පිණිස ඕිලා වෙත යම් පදනමක් තිබේද?

ඕිලා ට උපදෙස් දෙන්න.

(ලකුණු 25)

4. ඔරිගානෝ යනු බහුවාර්ගික රාජ්‍යයක් වන ජීරා හි පිහිටි කලාපයකි. ඔරිගානෝ , ජීරා හී ආර්ථිකයට දායකත්වයක් සපයන ස්වභාවික සම්පත්වලින් අනූන වේ. මෑතකදී ඔරිගානෝ ජාතික පක්ෂය ජීරා වෙතින් ස්වාධීනතාවය ප්‍රකාශයට පත්කරන ලදී. ඔවුන් ප්‍රකාශකර සිටින්නේ ජීරා විසින් ශතවර්ශ ගණනාවක් පුරාවට ඔරිගානෝ ප්‍රජාවගේ අයිතිවාසිකම් හා නිදහස යටපත් කරගෙන සිටින බවත්, එබැවින් ඔවුන්ට තනිව ඉදිරියට යාමට අවශ්‍ය බවත්ය. ඔරිගානෝ ජාතික පක්ෂය, ඔරිගානෝ කලාපීය මැතිවරණය 'අපගේ ස්වාධීනතාවය උදෙසා' යන පාඨය යටතේ තරග කළ අතර, ඡන්ද 80% කින් ජයග්‍රහණය කරන ලදී. ඔරගානෝ ජාතික පක්ෂය තමන්, ඔරිගානෝ ස්වාධීන ජනරජයේ නිල ආණ්ඩුව බවට ප්‍රකාශයට පත් කරන ලදී.

කෙසේ වුවද, ජීරා හී ජනාධිපතිවරයා කියාසිටියේ ඔරිගානෝ යනු තවමත් ජීරා හි කලාපයක් බවත්, එය අනාගතයේ දී ද එසේ පවතින බවත්ය. තවද ඔහු ජාතික සන්නද්ධ හමුදාවන්ට ඔරිගානෝ වෙත යන ලෙසත් එහි තත්ත්වය පාලනය කරන ලෙසත් අණ කරන ලදී.

සියඹලා යනු ඔරිගානෝ කලාපයේ විශාල පරිමාණයෙන් ආයෝජනය කර තිබෙන කාර්මීකරණය වූ රාජ්‍යයකි. ඔබ සියඹලා හි නීති උපදේශක බව උපකල්පනය කරන්න. අදාල අන්තර්ජාතික රීතීන් වලට අනුව ඔරිගානෝ සහ ජීරා සමග ඔවුන්ගේ සබඳතාවය ගැන සියඹලා වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 100)

5. <u>අ සහ ආ කොටස් දෙකටම</u> පිළිතුරු සපයන්න.

අ. කැන්ඩියානා ජාතික නීති විද්‍යාලයේ 'පරමාධිකාරි විනිර්මුක්තිය හා තානාපති විනිර්මුක්තිය අතර වෙනස' පිළිබඳව ආරාධිත දේශනයක් සඳහා ඔබට ආරාධනා ලැබී ඇත. මෙම සංකල්ප ද්විත්වයේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳව අවධාරණය කරන ලෙස ඔබගෙන් අපේක්ෂා කෙරේ.

සුදුසු උදාහරණ වලට අවධානය යොමු කරමින් දේශනය කෙටුම්පත් කරන්න.

(ලකුණු 50)

ආ. සීබා හි සිවිල් සංවිධාන ක්‍රියාකාරකයින් ආණ්ඩුවේ දූෂණයට හා බලය අයුතු ලෙස භාවිතයට එරෙහිව විරෝධතාවය පළකරමින් සිටිති. ඔවුන් සීබා හී අගනුවර විරෝධතා පෙළ පෙළපාළියක් සංවිධානය කර තිබේ. විරෝධතා පෙළ පෙළපාලිය අතරතුර දී , පොලිසිය විරෝධතාකරුවන්ට වෙඩිතැබීම් ආරම්භකළ අතර, එකී විරෝධතාකරුවන් සමහරක් සීබා හි සිලෝනිකා තානාපති කාර්යාලය ඉදිරිපිට සිටගෙන සිටියහ. දේවී සිලෝනිකා හී තානාපති නිලධාරිනියක් වන අතර ඇය තුවාලත් විරෝධතාකරුවන් කිහිපදෙනෙකුට තානාපති පරිශ්‍රය තුළ ආරක්ෂාව ලබා දෙන ලදී. පසුව විරෝධතා සංවිධායකයින් කිහිපදෙනෙකුට රටින් පිටව ගොස් සිලෝනිකා හි රැකවරණය පැතීමට ඇය උපකාර කරයි. සීබා හි අගනුවර මහේස්ත්‍රාත් අධිකරණය විසින්, සීබා හි ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන අභ්‍යන්තර කැරැල්ලකට උපකාර කිරීම යන පදනම මත, දේවි ව අත්අඩංගුවට ගැනීමට වරෙන්තුවක් නිකුත් කරන ලදී.

මේ අතරතුර, අසල්වැසි රාජ්‍යය වන හීරා රාජ්‍යයේ මානව හිමිකම් කණ්ඩායමක් විසින් සීබා හි ආරක්ෂක ඇමති වන කරන් ට එරෙහිව විරෝධතාකරුවන්ට සිදුකළ හානිය වෙනුවෙන් හීරා හී අධිකරණය ඉදිරියේ නඩු පවරා තිබේ.

කරන්ට සහ/හෝ දේවිට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග ගත හැකිද? පවත්නා අන්තර්ජාතික නීතියේ ප්‍රතිපාදන ඇසුරෙන් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 50)

6. චන්ඩි රාජ්‍ය සහ රණ්ඩු රාජ්‍යයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතර දැනට පවත්නා සාම සාකච්ඡා වලට පටහැනිව, රාජ්‍ය දෙක අතර ප්‍රචණ්ඩත්වය, රොකට් හා ඩ්‍රෝන ප්‍රහාර ද ඇතුළුව, 2021 වර්ෂය තුළ ඉහළ යමින් පවතී. මෙම තත්ත්වය ප්‍රවෘත්තිවලින් හා සමාජ මාධ්‍ය ජාලා හරහා, නොසන්සුන්තාවය ඉහළයන, දේශපාලනික පල්වීම, කලාපීය අස්ථාවරත්වයක් හා බලපෑමට ලක්වන ජනතාවගේ බලාපොරොත්තු සුන්වීම උද්දීපනය කරන තත්ත්වයක් ලෙස විස්තර කර තිබේ. මාර්ගගත මත විමසීම් මගින් පෙන්වා දී තිබෙන්නේ සාමය සහ යුද්ධය වැළැක්වීම සම්බන්ධයෙන් වන අන්තර්ජාතික ක්‍රියා මාර්ගයන් පිළිබඳව, ගෝලීය ප්‍රජාව ගේ අවිශ්වාසය ඉහළ යමින් තිබෙන බවයි.

ඔබ යුද්ධය හා සාමය පවත්වාගෙන යාම හා අන්තර්ජාතික ප්‍රශ්න සඳහා සාමකාමී විසඳුම් සැපයීමේ ලා අන්තර්ජාතික නීතිය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ භූමිකාව පිළිබඳ වෙබ් පිටුවකට (blogpost) සටහනක් ලිවීමට තීරණය කළ නීති විශාරදයකු බව උපකල්පනය කරන්න. අන්තර්ජාතික නීතියේ අදාල ප්‍රතිපාදන සහ ලෝකයේ සැබෑ උදාහරණ ඇසුරින් එම වෙබ් සටහන් ලියන්න.

(ලකුණු 100)

**************